# තුන් සූත්‍රවල අර්ථය
# පදයෙන් පදය
# දැන ගනිමු

පූජ්‍ය දැරංගල කුසලඥාණ හිමි

උතුම් ධර්ම දානයක් ලෙස පිලිගන්වන්නේ බැතියෙනි

ධර්ම දානය පිණිසයි

පළමු මුද්‍රණය 2012
දෙවන සංස්කරණය 2014

Copyright © 2014 Ven. D. Kusalagnana
All rights reserved.
ISBN:
ISBN-13:

මුද්‍රණය

දිමුතු ප්‍රකාශන පුද්ගලික සමාගම
නො.103/A,
නුවර පාර, යක්කල.
දුරː 033-2239662 / 077-8829705
විද්‍යුත් තැපෑලː dimuthupub@yahoo.com
වෙබ්ː www.dimuthupublication.com



“ස්වාමීනි,ගොඩක් දෙවිවරුත්, මිනිස්සුත් මංගල කරුණු ගැන සිතුවා. ඒ අයට යහපතක් වෙන්න අපට මංගල කරුණු කියලා දෙන්න.”

**-මංගල සූත්‍රය**

“ආනන්දය, මේ සූත්‍රය මතක තියාගෙන සජ්ඣායනා කරලා මුළු නුවරටම පිරිත් පැන් ඉහින්න.”

**-රතන සූත්‍රය**

“මහණෙනි, මං ආයුධයක් දෙන්නම්, ඒකත් අරන් නැවතත් ඒ කැලේටම යන්න.”
“ස්වාමීනි, කුමක් ද ඒ ආයුධය?”

**-කරණීයමෙත්ත සූත්‍රය**





## කතුහිමියන්ගේ පණිවිඩය

තුන් සූත්‍රය පදයෙන් පදය අර්ථ සහිත ව දැන ගැනීමට කැමති පිංවතුන් උදෙසා මෙම දහම් පඬුර මහනුවර, සමර්ෆීල්ඩ් නිවසක පැවැත් වූ ධර්ම දේශනාවක දී කරණීයමෙත්ත සූත්‍ර පදයෙන් පදය අර්ථ පැහැදිලි කර දුන් ආකාරය දැක චිත්ත ප්‍රසාදයට පත් ව තුන් සූත්‍රයට ම එසේ අර්ථ සපයා දෙන්නැයි කළ ඉල්ලීමත් එසේ කළහොත් කුඩා පොත් පිංචක් සකසා බෙදා දෙන්නේ යැයි ද යන අදහසත් පණ්ඩුල අලුවිහාරේ මහතා විසින් ගෙන ආ බැවින් මෙම දහම් පඬුර මෙසේ සකසන ලදි. එම පොත් පිංච ම නැවතත් සංස්කරණය කොට පළ කෙරෙන දෙවන අදියර යි මේ.

වැඩි දුර අධ්‍යාපන කටයුතු සඳහා ඉතාලියේ ත්‍රෙන්තෝ විශ්ව විද්‍යාලයයට පැමිණ සිටින අතරතුර මසකින් නිම කිරීමට අදහස් කළ මෙම කර්තව්‍යය සිවු මසක් තිස්සේ වෙහෙස නො බලා කළ බැවින් මෙසේ ඔබ අතට පත් කිරීමට හැකි විය.

මා මෙලොවට බිහි කළ ආදරණීය මෑණියන්ටත්, පියාණන් වන දැනට පැවිදි ව ආරණ්‍යවාසී ව වැඩ වසන පූජ්‍ය දැරංගල විමල ස්වාමීන් වහන්සේටත්, පූජ්‍ය දැරංගල හේමානන්ද පොඩි හාමුදුරුවන් වහන්සේ ඇතුළු සහෝදර සහෝදරියන්ටත් ධර්මාවබෝධය වේවා!

එසේ ම මා වෙත ප්‍රව්‍රජ්‍යා ජීවිතය දායාද කළ මාතර පළාතේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය හැටිඹිවිට ඉන්දරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේටත්, ඊට කැපවුණු පූජ්‍ය දම්පහල හේමසිරි ලොකු හාමුදුරුවන් වහන්සේ බන්දුල මහතා ඇතුළු සෑම දෙනාටත් නීරෝගී සුව දීර්ඝායුෂ වේවා!

බලගොල්ල බෞද්ධ මධ්‍යස්ථානාධිපති බඹරගල රාජමහා විහාරාධිපති ගෞරවාස්පද තල්පොත ධම්මජෝති නායක මාහිමිපාණන් වහන්සේගේ ආශිර්වාදය නො වන්නට මේ කිසිදු කටයුත්තක් සිදු නො කෙරෙනු ඇත. උන්වහන්සේගේ උතුම් සසුන් මෙහෙවර නො සිඳී තව බොහෝ කලක් පවතින්නට

උන්වහන්සේට නීරෝගී සුවය සහ දීර්ඝායු ලැබේවා යි ප්‍රාර්ථනා කරමි.

මෙම කුඩා ග්‍රන්ථය කිසිදු මුදලක් අය නොකොට පරිගණක ගතකරදීමට උපකාරී වූ ඩී. අයි. ජී. වීරසිංහ මහතාට ධර්මාවබෝධය ලැබේවා!

මෙම උතුම් දහම් පඬුර ස්වකැමැත්තෙන් මුද්‍රණය කරවා ඔබ අතට පත්කිරීමට වෙහෙසවූ එන්ගලන්තයේ ලන්ඩන් නුවර කිංස්ටන් විශ්වවිද්‍යාලයේ ආචාර්ය ලසිත් ප්‍රියංග යසකේතු සොහොයුරාට සහ චමුදි විතානවසම් සොහොයුරියටත් සියලු යහපත සහ සැනසිල්ල මෙන්ම නිර්වාණ අවබෝධය මේ දිනූ මනුෂ්‍යය ජීවිතයේදීම සාක්ෂාත් වේවා!

ධර්ම ප්‍රාර්ථනා සමෘද්ධි වීමෙන් ඔබටත් උතුම් නිවීමම සැනසිල්ල ම උදා වේවා!

2014 මැයි 25 වන දින
ඇමෙරිකාවේ ධම්මසුබ භාවනා මධ්‍යස්ථානයේ සිට



**සබ්බ දානං ධම්ම දානං ජිනාති**

**සියලු දානයන් අභිබවා ධර්ම දානය ජයගනී**

## පුණ්‍යානුමෝදනාව

තමන් සතු බුදුදහම හා පාලි භාෂාව පිළිබඳ දැනුම මනාව හසුරවමින් හා දෙස්විදෙස් වල ධර්ම ප්‍රචාරක කටයුතුවලින් ලත් අත් දැකීම් උපයෝගී කරගනිමින් **පූජ්‍ය දැරංගල කුසලඥාන** ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණය කර ධර්ම දානයක් ලෙස බෙදාදීමට අවස්ථාවක් ලබාදීම පිළිබඳව උන්වහන්සේට අපගේ නමස්කාර පූර්වක ස්තුතිය පුදකරන අතර මෙවන් වටිනා ධර්ම ග්‍රන්ථ තව තවත් එළිදැක්වීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු. එමෙන්ම අප මෙලොවට බිහිකර, සාරධර්ම කෙරෙහි නැඹුරුවක් ඇතිකොට මනා ශික්ෂණයක් ලබාදුන් අපගේ දයාබර දෙමව්පියන්ටත්, ශිල්පීය ඥානය ලබාදුන් ගෞරවණීය ගුරුභවතුන්ටත්, අපගේ දිවි ගමන සාර්ථක කර ගැනීමට විවිධ අයුරින් උපකාරකල ඥාති හිතමිත්‍රාදීන් ඇතුළු කළ්‍යාණ මිත්‍රයින්ටත්, මුද්‍රණ කටයුතු අලංකාර ලෙස කරදුන් යක්කල දිමුතු මුද්‍රණාලයේ අධිපති එච්.එම්.එච්. බණ්ඩාර මහතා ඇතුළු කාර්යය මණ්ඩලයටත් මෙම ගෞතම බුද්ධ ශාසනයේදීම චතුරාර්‍ය්‍ය සත්‍යයය අවබෝධවී උතුම් නිර්වාණාවබෝධය ලබා ගැනීමට මෙම ධර්ම දානමය කුසලය උපනිශ්‍රය වේවායි ප්‍රාර්ථනා කරමු.

**ලසිත් ප්‍රියංග යසකේතු**
**චමුදි විතානවසම්**



## පොත ගැන වදනක් ...

මෙම කුඩා දහම් පඬුර පිළිබඳව වචනයක් ප්‍රකාශ කිරීමට ලැබීම මාගේ සතුටට හේතුවකි.

අප අස්ගිරි මහාවිහාර මහ පිරිවෙණෙහි ආචාර්ය වරයෙකු වශයෙන් සේවය කළ **දැරංගල කුසලඤාණ** හිමියන් ධර්ම කාරණා සරලව පැහැදිලි කරදීමේ උනන්දුව සහ හැකියාව ඇති විශේෂයෙන්ම භාවනාව පිළිබඳව බොහෝ දෙනාට ප්‍රසාදය ඇතිවන අයුරින් කියාදීමෙහි හැකියාව ඇති භික්ෂූන් වහන්සේ නමකි.

උන්වහන්සේ අධ්‍යාපනික වශයෙන් රාජකීය පණ්ඩිත උපාධිය ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයෙන් ගෞරව ශාස්ත්‍රවේදී ප්‍රථම පන්ති සාමාර්ථයක් ද, කැළණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයෙන් පිරිනමන ස්වර්ණ මුද්‍රිකාව හා ශාස්ත්‍රපති උපාධිය ද යන උභය උපාධීන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා, ඉතාලියේ ත්‍රෙන්තෝ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ශිෂ්‍යත්වයක් ද ඇමෙරිකාවේ හාවඩ් විශ්වවිද්‍යාලයෙහි වැඩිදුර අධ්‍යාපනය ලැබීමට ශිෂ්‍යත්වයක් ද ලැබීමට වරම් ලැබූ භික්ෂූන් වහන්සේ නමකි.

ඒ අතර උන්වහන්සේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් හා පල්ලෙකැලේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු වශයෙන් ද සේවය කර ඇත.

ඒ සියල්ල අභිබවා යන නිහතමානී ගුණයෙන් යුතු උන්වහන්සේ දෙස් විදෙස් ධර්ම ප්‍රචාරයෙහි නිරතුරු වෙහෙස වෙමින් විශාල අත්දැකීම් සම්භාරයක් ලබා ඇත.

විශාල ධර්ම ග්‍රන්ථ වෙනුවට මෙවන් වටිනා පොත් සකස්කර ඔබ අතට පත්කිරීම ශාසනික චිරස්ථිතියට මහත් සේ උපකාරී වන්නකි. උන්වහන්සේ ඉංග්‍රීසි - සිංහල භාෂාද්වයෙන් ලියා ඇති ග්‍රන්ථ අතර මෙම ග්‍රන්ථයේ ඇති විශේෂත්වයක් වන්නේ ඒ ඒ



සූත්‍රවල නිදාන කථාව සහ ධර්මාවබෝධයට ඇති උපයෝගීතාවය ද පෙළගස්වා තිබීමයි. නිතර දේශනා කරන තුන් සූත්‍රවල අර්ථ දැනගැනීමට ඇති අවස්ථා විරල ය. බොහෝ විට පිරුවාණා පොත් වහන්සේ පරිහරණය කරනු ලබන්නේ භික්ෂූන් වහන්සේ විසිනි. එබැවින් ගිහි ප්‍රජාවට මෙම සූත්‍ර අර්ථවත්ව භාවිතයට අවස්ථා විරල ය. එම අඩුව පුරවාලමින් නිවැරදි උපදෙස් ඇතිව පිළියෙල කර ඇති ඇති මෙම ග්‍රන්ථය හැම කාලයටම ද බාල, තරුණ, මහළු හැම දෙනාටම ද නිවෙස්වල බුද්ධ වන්දනාවේදී සහ නිවසේ පිරිත් සජ්ඣායනාවලදී භාවිතයට ගත හැකි වටිනා ග්‍රන්ථ රත්නයක් වනු ඇත.

මෙවන් ධර්ම කටයුතු තව තවත් ඔබ අතට පත් කරන්නට දැරංගල කුසලඤාණ ස්වාමීන් වහන්සේට නිරතුරු ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය ලැබේවා! ඔබ සැමටත් ධර්මාවබෝධය ලැබේවා!

**ශාස්ත්‍රපති නාරම්පනාවේ ආනන්ද ස්ථවිර,**
**අස්ගිරි පාර්ශවයේ කාරක සංඝ සභාවේ නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**පරිවේණාධිපති, මහා විහාර මහ පිරිවෙණ, අස්ගිරිය,**
**මහනුවර.**

# පටුන


කතු හිමියන්ගේ පණිවිඩය ………………………………… iv

පුණ්‍යානුමෝදනාව ……………………………………………. vi

පොත ගැන වදනක් … ………………………………………. vii

පටුන……………………………………………………………… ix

පූර්විකාව ………………………………………………………. x

මහා මංගල සූත්‍රය………………………………………… 11

  නිධාන කතාවː……………………………………………………11

  මහා මංගල සූත්‍රයේ අර්ථය පදයෙන් පදය………………12

රතන සූත්‍රය ……………………………………………… 15

  නිධාන කතාවː……………………………………………………15

  රතන සූත්‍රයේ අර්ථය පදයෙන් පදය …………………………16

කරණීයමෙත්ත සූත්‍රය ……………………………………… 25

  නිධාන කතාව ……………………………………………………25

  කරණීයමෙත්ත සූත්‍රයේ අර්ථය පදයෙන් පදය ……….27

මෛත්‍රීභාවනාවෙන් නිවන් අවබෝධ කළ හැකි ද?… 31

ආශ්‍රිත ග්‍රන්ථාවලිය …………………………………… 36




# පූර්විකාව

සෙත් පිරිත් දේශනාවක දී තුන් සූත්‍රය සජ්ඣායනා කරන පිළිවෙළක් තිබේ. එනම්, මුලින් ම මහා මංගල සූත්‍රයත්, දෙවනු ව, රතන සූත්‍රයත් අවසානයේ දී, කරණීය මෙත්ත සූත්‍රයත් සජ්ඣායනා කොට භවතු සබ්බ මංගලං ආදී ආශිර්වාද ගාථා කීමෙන් අවසන් කිරීම යි. මෙහි සූත්‍ර පෙළ ගස්වා ඇත්තේ එම පිළිවෙළට ය.

අපගේ බෞද්ධ පිංවතුන්ට මෙම සූත්‍ර කට පාඩම් බැවින් වෙන ම සූත්‍ර එකතු කිරීමෙන් කොළ වැඩි කිරීමට අවශ්‍ය නැතැයි සිතමි. මෙහි දී වෙන ම සූත්‍රගත ගාථා පෙන්වා දී ඇත්තේ රතන සූත්‍රයේ පමණි. අනෙක් සූත්‍රවල එසේ කිරීමට අවශ්‍ය නැත.

එසේ ම පාලි කියවීමට නො දන්නා කුඩා දරුවකුට වුව ද කියවීමට හැකි වන අයුරින් සිංහල ලියන ක්‍රමයට මෙහි පාලි වචන ලියා ඇත. එබැවින් නිතර දෙවේලේ  මෙම වටිනා සූත්‍ර අර්ථ පිළිබඳ ව සැලකිල්ලෙන් කියා ඔබටත් ධර්මාවබෝධය ලබා ගත හැකි ය. ඒ ඒ සූත්‍රවල වටිනාකමත්, දේශනා කිරීමට හේතුවත් ඒවායෙහි නිවන් අවබෝධයට ඇති උපයෝගිතාවත් සෑම සූත්‍රයක ම මුලට සහ අවසානයේ දී පෙන් වා දී ඇත.

මෙබඳු සූත්‍රවල ඇති වටිනාකම කෙමෙන් කෙමෙන් මගහැරීයන යුගයක ඔබගේ භාවනාමය අවබෝධයට සහ ලෞකික අභිවෘද්ධියට ද ආරක්ෂාවට ද උපකාරීවන මෙම සූත්‍ර දේශනා තුළ ඇති අර්ථ දැනගැනීම තුළින් බොහෝ හාස්කම් ඔබට අත්විඳීමට හැකිවනු ඇත. මෙම සූත්‍ර දේශනාතුළ විශාල බලයක් ගැබ්ව තිබේ. එම බලයෙන් ඵල ලැබීමට නම් අර්ථ දැන ගත යුතුම ය.

පිරිත් සූත්‍රවල බලය ගැන සඳහන්වන වටිනා ගාථා ධර්මයක් තිබේ. එම ගාථා ධර්මය අසා දැන ගත්තේ මාතර පීක්වැල්ල පන්ථාරාමාධිපතිව වැඩ සිට අපවත් වී වදාළ මාතර පළාතේ ප්‍රධාන සංඝනායක සරභඤ්ඤ විසාරද උෟරුමුත්තේ සෝමරතන නායක මාහිමිපාණන්ගෙනි. ඒ මෙසේයː

"සම්බුද්ධ දේසිත මහග්ග පරිත්ත ධම්මං
යෝ සාදරේන සවනං කුරුතේ සමිච්ච
සබ්බන්තරාය භය රෝග ව්‍යාධි ධම්මං
ධූරී භවන්ති සලිලං විය පොක්ඛරස්මා"

එහි අර්ථය නමː "සම්බුදුරජාණන් වහන්සේගේ මුවින් දේශනා වුණු මහාර්ඝ පිරිත් ධර්මය යමෙක් වෙනත් කටයුතු පසෙක ලා ඉතා ගෞරවයෙන් ශ්‍රවණය කරයි ද, ඔහුගේ සියලු අනතුරු, භය, රෝග, ව්‍යසනයන් නෙළුම් කොළයකට වැටුණු දිය බිඳුව ඉවතට විසි වී යන්නාක් මෙන් දූරීභූත වේ" යන්න යි.

ඔබටත් මේ උතුම් සූත්‍ර දේශනා අවබෝධයෙන් ඔබගේ නිර්වාණාවබෝධය සාක්ෂාත් වේවා!

# මහා මංගල සූත්‍රය

## නිධාන කතාව:

දෙවියන් සහිත ලෝකයෙහි ඒ ඒ කාලවල ඇති වන කෝලාහල පිළිබඳ ව ධර්මයේ සඳහන් වේ. ඒ අනුව

1. මංගල යනු කුමක් දැ යි තේරුම් ගැනීම සඳහා ඇති වන කෝලාහලය මංගල කෝලාහලය යි.
2. සක්විති රජ කෙනකු පහළ වේ යැයි ඇති වන ආන්දෝලනය සක්විති කෝලාහලය යි.
3. ලෝක විනාශයේ දී ඇති වන කෝලාහලය කල්ප කෝලාහලය යි.
4. බුදුවරයකු පහළ වේ යැයි ඇති වන කෝලාහලය බුද්ධ කෝලාහලය යි.

බුදුන් දවස දඹදිව මංගල යනු කුමක් දැ යි වාදයක් හට ගත්තේ ය. ඒ පිළිබඳ ව එකිනෙකා විවිධ අදහස් දැරූ අතර සමහරෙක් ඇසට පෙනෙන දේ මංගල යැයි කීහ. 'දිට්ඨ මංගලිකා' යන නමින් හැඳින්වුණු මොවුහු ඇසට පෙනෙන හොඳ දෙය මංගල ලෙසත්, නරක දෙය අවමංගල ලෙසත් පිළිගත්හ. තවත් සමහරෙක් කණට ඇසෙන දේ මංගල යැයි කීහ. ඔවුන් හැඳින් වූයේ 'සුත මංගලිකයින්'යනුවෙනි. ඔවුන්ගේ පිළිගැනීම වූයේ කනට ඇසෙන මිහිරි දේ මංගල බවත්, අමිහිරි දේ අවමංගල බවත් ය. ඇතැමෙක් ශරීරයට දැනෙන ස්පර්ශය මංගල යැයි කීහ. 'මුත මංගලිකයින්'නමින් හැඳින්වුණු ඔවුහු ශරීරයට දැනෙන සැපදායක ස්පර්ශය මංගල බවත්, කටුක ස්පර්ශය අවමංගල බවත් පිළිගත්හ. මෙසේ මිනිස්සු තුන් කොටසකට බෙදී තම තමන් ගත් මතය සත්‍යය යැයි ඔප්පු කිරීමට දිගු කලක් මුළුල්ලේ විවාද කළහ. එහෙත් දිනූ පක්ෂයක් නැත. දොළොස් වසරක් පුරා පැවති මෙම වාදයෙන් පිරිස් පිල්වලට බෙදී ගිය අතර අවසන් තීරණයකට එළැඹීමට ද නොහැකි විය. මිනිසුන් අතර ඇති වූ මෙම මංගල කෝලාහලය පසු ව දෙවියන් අතර ද පැතිරිණ. ඔවුන්ගෙන් බඹ ලොව වැසි බ්‍රහ්මයන් අතර ද එය පැතිර ගියේ ය.

සියල්ලෝ ම කොටස්වලට බෙදී වාද කරති. එහෙත්



දිනන්නෙක් නැත්තාහ. මෙම පැනයට විසඳුම් සොයන්නට කල්පනා කළ ශක්‍ර දේවේන්ද්‍රයා එක්තරා දෙවියකු කැඳවා සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ සිටි බුදුන් වහන්සේ වෙත යවා පැනයට නියම විසඳුම ලබා ගෙන එන්නැයි කීවේ ය. සැණෙකින් තව්තිසා දෙව්ලොවින් අතුරුදහන් වූ ඒ දිව්‍ය පුත්‍රයා සැවැත් නුවර දෙව්රම් වෙහෙරට සම්ප්‍රාප්ත වූයේ ය.මධ්‍යම රාත්‍රියේ ඉතා සිත්කලු ශරීර වර්ණයෙන් මුළු ජේතවනාරාමය ම බබළවමින් පැමිණි දෙව් තෙමේ බුදුරදුන් වෙත ගොස් වැඳ එකත් පසෙක සිට "බහූදේවා මනුස්සාච මංගලානි අචින්තයුං" ආදී ගාථාවෙන් මංගල ප්‍රශ්නය විචාළේ ය. බුදුරජාණන් වහන්සේ ඊට පිළිතුරු වශයෙන් මංගල කරුණු තිස් අටක් අඩංගු මහාමංගල සූත්‍රය දේශනා කළ සේක. ලෞකික ජීවිතයටඅදාළ කරුණු තිස් දෙකකුත්, ලෝකෝත්තර ජීවිතයට අදාළ කරුණු හයකුත් වශයෙන් උභය ලෝක සංසිද්ධි කාරණා තිස් අටක් ඇතුළත් මහා මංගල සූත්‍රය දේශනා කරමින් බුදුන් වහන්සේ මංගල ප්‍රශ්නය විසඳූ සේක.

## මහා මංගල සූත්‍රයේ අර්ථය පදයෙන් පදය

**"ඒවං**-මෙසේ, **මේ**- මා විසින්, **සුතං** - අසන ලදි.
**ඒකං** - එක්, **සමයං** - කාලයක දී, **භගවා** - භාග්‍යවතුන් වහන්සේ,
**සාවත්ථියං** - සැවැත් නුවර, **ජේතවනේ** - ජේතවන නම් වූ, **අනාථ පිණ්ඩිකස්ස ආරාමේ** - අනේපිඬු සිටුහුගේ ආරාමයේ,**විහරති** - වැඩ වසන සේක.
**අථ ඛෝ අඤ්ඤතරා දේවතා** - ඉක්බිති එක් දිව්‍ය පුත්‍රයෙක්,
**අභික්කන්තාය රත්තියා** - සිත්කලු රාත්‍රියෙහි (පෙරයම ඉක් ම ගිය විට),
**අභික්කන්ත වණ්ණා** - සිත්කලු ශරීර වර්ණයෙන්,
**කේවලකප්පං ජේතවනං** - මුළු ජේතවනාරාමය ම,
**ඕභාසෙත්වා** - බබුළු වා,
**යේන භගවා** - භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක වැඩ සිටි සේක් ද,
**තේනුපසංකමි** - එතැනට පැමිණියේ ය.
**උපසංකමිත්වා** - එසේ පැමිණ,
**භගවන්තං අභිවාදෙත්වා** -භාග්‍යවතුන් වහන්සේ වැඳ,
**ඒකමන්තං අට්ඨාසි** - එකත්පස් ව සිටියේ ය.

**ඒකමන්තං ඨිතා බෝ** - එකත්පස් ව සිටියා වූ,
**සා දේවතා** - ඒ දිව්‍ය පුත්‍රයා,
**භගවන්තං ගාථාය අජ්ඣභාසි** - බුදුරදුනට ගාථාවකින් මෙසේ දැනුම් දුන්නේ ය.
**බහූ දේවා මනුස්සා ච** -බොහෝ දෙවියෝත්, මිනිස්සුත්,
**මංගලානි අචින්තයුං** - මංගල කරුණු සිතූ සේක.
**ආකඞ්ඛමානා සොත්ථානං** - ඔවුන්ට යහපත පිණිස,
**බ්‍රෑහි මංගල මුත්තමං** - ඒ උතුම් මංගල කරුණු ගැන දේශනා කරන සේක්වා.
(1)**අසේවනා ච බාලානං** - අසත්පුරුෂ බාලයින් ඇසුරු නො කිරීම ද,
(2)**පණ්ඩිතානං ච සේවනා** - සත්පුරුෂ පඬිවරුන් ඇසුරු කිරීම ද,
(3)**පූජාච පූජනීයානං** - පිදිය යුත්තන් පිදීම ද,
**ඒතං මංගල මුත්තමං** - (යන මේ කරුණු තුන) උතුම් මංගලයන් ය.
(4)**පතිරූප දේස වාසෝ ච** - සුදුසු දේශයක විසීම ද,
(5)**පුබ්බේ ච කත පුඤ්ඤතා** - පෙර කරන ලද පින් ඇති බව ද,
(6) **අත්ත සම්මා පණිධීච** - සිත මනා කොට පිහිටුවා ගැනීම ද,
**ඒතං මංගල මුත්තමං** - (යන මේකරුණු තුන) උතුම් මංගලයන් ය.
(7)**බාහුසච්චං ච** - බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ද,
(8)**සිප්පං ච** - ශිල්ප දැනීම ද,
(9)**විනයෝ ච** - නීති ගරුක බව ද,
(10)**සුසික්ඛිතෝ** - යහපත් කටයුතුවල මනා හික්මීම ද,
(11) **සුභාසිතා ච යා වාචා** - යහපත් වචන කතා කිරීම ද,
**ඒතං මංගල මුත්තං** (යන මේ කරුණු පහ) උතුම් මංගලයන් ය.
(12)**මාතා පීතු උපට්ඨානං** - මවුපියන්ට උපස්ථාන කිරීම ද,
(13)**පුත්ත දාරස්ස සංගහෝ** - අඹු දරුවන්ට සැලකීම ද,
(14)**අනාකුලා ච කම්මන්තා** - නිරවුල් රස්සාවල යෙදීම ද,
**ඒතං මංගල මුත්තමං** (යන මේ කරුණු තුන) උතුම් මංගලයන් ය.
(15) **දානං ච** - දන් දීම ද,
(16)**ධම්ම චරියාච** - දැහැමි ජීවිතයක් ගත කිරීම ද,
(17)**ඤාතකානාංච සංගහෝ** - නෑයන්ට සංග්‍රහ කිරීම ද,
(18) **අනවජ්ජානි කම්මානි** - (ප්‍රාණඝාථාදී අකුසලතාවන්ගෙන් වැළකීම වැනි) නිවැරදි ක්‍රියා ද,
**ඒතං මංගල මුත්තමං** - (යන මේ කරුණු හතර) උතුම් මංගලයන් ය.



(19)**ආරති විරති පාපා** - පවෙහි නො ඇලීම හා ඉන් වෙන් වීම ද,
(20)**මජ්ජපානා ච සඤ්ඤමෝ** - මත් පැන්වලින් වැළකීම ද,
(21)**අප්පමාදෝ ච ධම්මේසු** - පමා නො වී කුසල් කිරීම ද,
**ඒතං මංගලමුත්තං** - (යන මේ කරුණු තුන) උතුම් මංගලයන් ය.
(22)**ගාරවෝච** - ගරු කිරීම ද,
(23)**නිවාතෝ ච** - යටහත් පැවැත්ම ද,
(24)**සන්තුට්ඨී ච**- ලද පමණින් සතුටු වීම ද,
(25)**කතඤ්ඤුතා** - කළගුණ දන්නා බව ද,
(26)**කාලේන ධම්ම සවණං** - සුදුසු කාලයෙහි ධර්මය ඇසීම ද,
**ඒතං මංගලමුත්තමං** - (යන මේ කරුණු පහ) උතුම් මංගලයන් ය.
(27)**ඛන්තීච** - ඉවසීම ද,
(28)**සෝවචස්සතා** - සුවච-කීකරු බව ද,
(29)**සමණානං ච දස්සනං** - ශ්‍රමණ-භික්ෂූන් වහන්සේ දැකීම ද,
(30)**කාලේන ධම්ම සාකච්ඡා** - සුදුසු කාලයෙහි ධර්ම සාකච්ඡා කිරීම ද,
**ඒතං මංගල මුත්තමං** - (යන මේ කරුණු සතර) උතුම් මංගලයන් ය.
(31)**තපෝ ච** - තපස ද,
(32)**බ්‍රහ්ම චරියං ච** - උතුම් බඹසර හැසිරීම ද,
(33)**අරිය සච්චාන දස්සනං** - ආර්ය සත්‍යයන් නුවණින් දැකීම ද,
(34)**නිබ්බාන සච්ඡිකිරියා ච** - නිවන් අවබෝධ කිරීම ද,
**ඒතං මංගල මුත්තමං** - (යන මේ කරුණු හතර) උතුම් මංගලයන් ය.
(35)**ඵුට්ඨස්ස ලෝක ධම්මේහි චිත්තං යස්ස න කම්පති** - අටලෝ දහමෙහි යමකුගේ සිත කම්පා නො වීම ද,
(36)**අසෝකං** - ශෝක නැති බව ද,
(37)**විරජං** - කෙලෙස් දූවිලි නැති බව ද,
(38)**ඛේමං** - බිය නැති බව ද,
**ඒතං මංගල මුත්තමං** - (යන මේ කරුණු හතර) උතුම් මංගලයන් ය.
**ඒතාදිසානි කත්වාන** - මෙබඳු මංගල කරුණු සම්පූර්ණ කොට,
**සබ්බත්ථ මපරාජිතා** - සියලු කෙළෙසුන්ට නො පැරදී,
**සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති** - සියලු තැන් හී දී සැපතට යෙති,
**තං තේසං මංගල මුත්තමං** - මෙය ඒ සියල්ල තුළ උතුම් ම මංගල්‍යය යි.

**ඔබට නිවන් මංගල්‍යය ම වේවා!**

**සාධු! සාධු! සාධු!**

# රතන සූත්‍රය

## නිධාන කතාව:

බුදුන් දවස විශාලා මහනුවර මහා දුර්භික්ෂයක් ඇති විය. ආහාර නොමැති ව කුසගින්නේ විශාල පිරිසක් මිය ගියහ.ඉවත් නො කළ මළමිනී කුණු වී හැමූ දුගඳින් මුළු නුවර ම දුර්ගන්ධවත් විය. එහෙයින් අමනුෂ්‍යයෝ  නුවර ආක්‍රමණය කළහ. මේ නිසා තව තවත් මිනිසුන් මිය යන්නට විය.

අධික ලෙස ගොඩ ගැසුණු කුණු වී ගිය මෘතදේහ හේතුවෙන් අහිවාතක නම් ඉතාමත් දරුණු රෝගයක් ඇති විය. මෙලෙස රෝග, දුර්භික්ෂ හා අමනුෂ්‍ය යන තුන් බියෙන් වෙළී ගිය නුවර වැසියෝ මේ බව රජතුමාට දැන් වූහ. බුදුන් වහන්සේ මේ නුවරට වැඩම කරවීමෙන් මෙම දුර්භික්ෂය දුරු කරගත හැකි වෙතැ යි යන්න රජතුමන්ගේ සහ වැසියන්ගේ තීරණය විය.

පසු ව බිම්බිසාර රජතුමන්ගේ අවසරය ඇති ව ලිච්ඡවී රජදරුවන් බුදුන් වහන්සේ හමු වී "ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, විශාලාවේ තුන්බියෙන් වෙළීගිය ජනතාවගේ හිතසුව පිණිස විශාලාවට වඩින්නැ" යි ආරාධනාවක් කළේ ය.

සම්බුද්ධ අණසකින් ලක්ෂයක් සක්වල ආරක්ෂාව සිදු වෙතැ යි සලකා පන්සීයක් සංඝයා වහන්සේලා සමඟ විශාලාවට වැඩම කළ බුදුන් වහන්සේ රතන සූත්‍රය දේශනා කළ සේක. ඒ සමඟ ම ඇද වැටුණු මහා වර්ෂාවෙන් මළ සිරුරු සියල්ල ගංගාවලට ගසා ගෙන ගොස් නුවර පිරිසිදු විය.

ආනන්ද හිමියන් අමතා තථාගතයින් වහන්සේ රතන සූත්‍රය ඉගෙන පූජා ද්‍රව්‍ය සහිත ව ලිච්ඡවී රජදරුවන් සමඟ විශාලාවේ තුන් පවුරු වටා පිරිත් පැන් ඉසින්නැ යි වදාළ සේක. ආනන්ද හාමුදුරුවන් ද බුද්ධ පාත්‍රයට පිරිත් පැන් ගෙන රතන සූත්‍රය දේශනා කරමින් මුළු නුවර ම පිරිත් පැන් ඉස්සාහ. මෙලෙස දින හතක් පුරා රතන සූත්‍රය දේශනා කිරීමෙන් තුන් බිය දුරු විය. නුවර වැසියෝ සැනසුණාහ.

මෙම සූත්‍රය මනා ව අවබෝධ කර ගැනීමෙන් ආරක්ෂාව සලසා ගැනීමටත්, නිවන් සාක්ෂාත් කර ගැනීමටත් ඔබට හැකි ය. මෙහි ඇති විශේෂත්වය නම් මෙහි අන්තර්ගත ගාථාවල බුද්ධ,



ධම්ම, සංඝ රත්නයන්හි ගුණ ස්වභාවයන් පැහැදිලි ව පෙන් වා දී සියලු ම ගාථා අවසානයේදී ඒ සත්‍ය බලයෙන් යහපත උදා වේවා යි ප්‍රාර්ථනා කිරීමයි. එබැවින් ම මෙම වටිනා සූත්‍රය තුන් පිටකයෙන් උකහා ගෙන පිරුවාණා පොත් වහන්සේට ඇතුළත් කොට ඇත. ඔබටත් නිවන් අවබෝධය පිණිස මෙම අර්ථ විවරණය මහෝපකාරී වේවා! ලෞකික මෙන් ම ලෝකෝත්තර ආරක්ෂාව අභිවෘද්ධිය සැලසේවා!

සාධු! සාධු! සාධු!

## රතන සූත්‍රයේ අර්ථය පදයෙන් පදය

**1. යානීධ භූතානි සමාගතානි - භුම්මානි වා යානිව අන්තලික්ඛෙ -සබ්බේව භූතා සුමනා භවන්තු - අථෝ පි සක්කච්ච සුණන්තු භාසිතං**

**යානි** - යම්, **ඉධ** - මෙහි, **භූතානි** - අමනුෂ්‍ය කෙනෙක්, - **සමාගතානි** - රැස් වූවාහු වෙත් ද, **භුම්මානි වා** - භූමියෙහි උපන්නා වූ හෝ, **යානිව** - යම්,**අන්තලික්ඛෙ** - අහසෙහි සිටින, **සබ්බේ ච භූතා** - ඒ සියලු අමනුෂ්‍යයෝ, - **සුමනා භවන්තු** - සතුටු සිත් ඇත්තාහු වෙත් වා. **අථෝ පි** - තව ද, **සක්කච්ච** - මනාකොට, **භාසිතං** - මාගේ වචනය. **සුණන්තු** - අසත් වා.

භූමියෙහි උපන්නා වූ හෝ අහසෙහි උපන්නා වූ හෝ යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස් වූවාහු වෙත් ද, ඒ සියලු භූතයෝ සතුටු සිත් ඇත්තාහු වෙත් වා. තව ද මාගේ වචනය මනාකොට අසත් වා.

**2. තස්මාහි භූතා නිසාමේථ සබ්බේ - මෙත්තං කරෝථ මානුසියා පජාය - දිවා ච රත්තෝච හරන්ති යෙ බලිං - තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා**

**තස්මාහි** - එහෙයින්, **භූතා** - අමනුෂ්‍යයනි, **නිසාමේථ සබ්බේ** - සියල්ලෝ ම මාගේ ධර්මය අසවු, **මෙත්තං කරෝථ මානුසියා පජාය** - මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි මෛත්‍රිය කරවු, **දිවා ච රත්තෝච** - රෑ දාවල්හි,**හරන්ති යෙ බලිං** - තොපට පූජා ගෙනෙත් ද?, **තස්මා හි** - එහෙයින්, **නේ** - ඔවුන්, **රක්ඛථඅප්පමත්තා** - අප්‍රමාදී ව රකිවු.

අමනුෂ්‍යයනි, (යම් කරුණක් සඳහා) තෙපි රැස් ව සිටින්නාහු ද? සියල්ලෝ ම මාගේ ධර්මය අසවු. මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි මෛත්‍රිය කරවු. යම් මනුෂ්‍ය කෙනෙක් රෑ දාවල්හි තොපට පූජා ගෙනෙත් ද? එහෙයින් රකිවු.

**3. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා - සග්ගේසු වායං රතනං පණීතං න නෝ සමං අත්ථි තථාගතේන - ඉදම්පි බුද්ධේ රතනං පණීතං - ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**යං කිඤ්චි** - යම් කිසි,**විත්තං** - ධනයක් (වේ ද), **ඉධ වා** - මේ මනුෂ්‍ය ලෝකයෙහි හෝ, **හුරං වා** -අවශේෂ ලෝකයෙහි, - **සග්ගේසු වා** - දිව්‍ය ලෝකයන්හි හෝ, **යං රතනං පණීතං** - යම් ප්‍රණීත රත්නයක් වේ ද?, **න නෝ සමං අත්ථි තථාගතේන** - තථාගතයින් හා සමාන ධනයක් හෝ රත්නයක් හෝ නැත් ම ය, **ඉදම්පි බුද්ධේ රතනං පණීතං** - බුදු රදුන් කෙරෙහි මෙය ද ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයෙකි, **ඒතේන සච්චේන සුවත්ථි හෝතු** - මේ සත්‍ය බලයෙන් සත්ත්වයිනට සෙත් වේවා.

මනුෂ්‍ය ලෝකයෙහි හෝ අවශේෂ ලෝකයෙහි හෝ යම් ධනයක් වේ ද, දිව්‍ය ලෝකයන්හි හෝ යම් රත්නයක් වේ ද? ඒ කිසි තැනෙක තථාගතයින් හා සමාන වූ ධනයක් හෝ රත්නයක් හෝ නැත් ම ය. බුදුරදුන් කෙරෙහි මෙය ද ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයෙකි. මේ සත්‍ය බලයෙන් සත්ත්වයිනට සෙත් වේවා.

**4. ඛයං විරාගං අමතං පණීතං - යදජ්ඣගා සක්‍ය මුනී සමාහිතො න තේන ධම්මේන සමත්ථි කිඤ්චි - ඉදම්පි ධම්මේ රතනං පණීතං ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**සක්‍ය මුනි** - ශාක්‍ය කුලයෙහි උපන් මුනි තෙම, **සමාහිතෝ** - සමාධියෙන් සුපිහිටි සිත් ඇතියේ, ඛයං - කෙලෙස් ක්ෂය වන, **විරාගං** - රාග දුරු කරන, **අමතං** - අමෘත, **පණීතං** - ප්‍රණීත වූ, **යදජ්ඣගා** - යම් නිවනක් නුවණින් අවබෝධ කළේ ද, **න තෙන ධම්මේන සමත්ථි කිඤ්චි** - ඒ නිර්වාණ ධර්මය හා සමාන වූ කිසි රත්නයෙක් නැත, **ඉදම්පි ධම්මේ රතනං පණීතං** - මෙය ද ධර්මයෙහි ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයෙකි, **ඒතේන සච්චේන සුවත්ථි හෝතු** - ඒ සත්‍ය බලයෙන් සෙත් වේවා.

ආර්ය මාර්ග සමාධියෙන් සුපිහිටි සිත් ඇති ශාක්‍ය කුලයෙහි උපන් මුනි තෙම රාගාදීන් ක්‍ෂය වන්නා වූ රාගාදියෙන් වෙන් වූ ප්‍රණීත යම් නිවනක් නුවණින් අවබෝධ කළේ ද, ඒ නිර්වාණ ධර්මය හා



සමාන වූ කිසි රත්නයෙක් නැත. මෙය ද ධර්මයෙහි ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයෙකි. ඒ සත්‍ය බලයෙන් සෙත් වේවා.

**5. යං බුද්ධ සෙට්ඨෝ පරිවණ්ණයී සුචිං - සමාධිමානන්තරිකඤ්ඤ මාහු -සමාධිනාතේන සමෝ න විජ්ජති - ඉදම්පි ධම්මේ රතනං පණීතං ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**යං බුද්ධ සෙට්ඨෝ** - බුද්ධ ශ්‍රේෂ්ඨ තෙමේ, **පරිවණ්ණයී සුචිං** - ඉතා සිරිසිදු යමක් ප්‍රශංසා කොට ප්‍රකාශ කෙළේ ද?, **සමාධිමානන්තරිකඤ්ඤ මාහු** - (එම ධර්මය) ආනන්තරික සමාධියයි කියති, **සමාධිනාතේන සමෝ න විජ්ජති** - ඒ සමාන වූ අන් කිසි සමාධියක් නැත,**ඉදම්පි ධම්මේ රතනං පණීතං** - මෙය ද ධර්මයෙහි ශ්‍රේෂ්ඨ රත්න භාවයෙකි. **ඒතේන සච්චේන සුවත්ථි හෝතු** - මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

බුද්ධ ශේෂ්ඨ තෙමේ ඉතා සිරිසිදු යමක් ප්‍රශංසා කොට ප්‍රකාශ කෙළේ ද? එය ආනන්තරික සමාධියයි කියති. ඒ සමාන වූ අන්කිසි සමාධියක් නැත. මෙය ද ධර්මයෙහි ශ්‍රේෂ්ඨ රත්න භාවයෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

**6. යේ පුග්ගලා අට්ඨ සතම්පසත්ථා - චත්තාරි ඒතානි යුගානි හොන්ති තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා - ඒතේසු දින්නානි මහප්ඵලානි ඉදම්පි සංඝේ රතනං පණීතං - ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**යේ පුග්ගලා අට්ඨ** - යම් අෂ්ටාර්යය පුද්ගල කෙනෙක් වෙත් ද,**සතම්පසත්ථා** - බුද්ධාදී සත් පුරුෂයින් විසින් පසස්නා ලද,**චත්තාරි ඒතානි යුගානි හොන්ති** - ඔවුහු යුග සතරක් වෙති,**තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා** - බුදුන්ගේ ශ්‍රාවක වූ ඒ ආර්යය පුද්ගලයෝ දක්ෂිණාවට සුදුසු වෙති,**ඒතේසු දින්නානි මහප්ඵලානි** - ඔවුන් කෙරෙහි දුන් දානයෝ මහත් ඵල ඇත්තාහු වෙති. **ඉදම්පි සංඝේ රතනං පණීතං** - මෙය ද සංඝයා කෙරෙහි ප්‍රණීත වූ රත්න භාවයෙකි,**ඒතේන සච්චේන සුවත්ථි හෝතු** - මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

බුද්ධාදී සත්පුරුෂයින් විසින් පසස්නා ලද යම් අෂ්ටාර්යය පුද්ගල කෙනෙක් වෙත් ද, ඔවුහු යුග සතරක් වෙති. බුදුන්ගේ ශ්‍රාවක වූ ඒ ආර්ය පුද්ගලයෝ දක්ෂිණාවට සුදුසු වෙති. ඔවුන් කෙරෙහි දුන් දානයෝ මහත් ඵල ඇත්තාහු වෙති. මෙය ද සංඝයා කෙරෙහි

ප්‍රණීත වූ රත්නභාවයෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

**7. යේ සුප්ප යුත්තා මනසා දළ්හේන - නික්කාමිනෝ ගෝතම සාසනම්හි තෙ පත්තිපත්තා අමතං විගය්හ - ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා - ඉදම්පි සංඝේ රතනං පණීතං - ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**යේ** - යම් රහත් කෙනෙක්,**සුප්ප යුත්තා මනසා දළ්හේන** - මනා කොට යෙදුනාහු ස්ථිර සිතින්, **නික්කාමිනෝ** - සියලු කෙළෙසුන්ගෙන් නික්මුණාහු,**ගෝතම සාසනම්හි** - ගෞතම ශාසනයෙහි, **තෙ** - ඔවුහු,**පත්තිපත්තා** - පැමිණිය යුතු රහත් ඵලයට පැමිණියාහු වෙති,**අමතං විගය්හ** - නිවනට බැස,**ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා** - ඵල සමවත් සුවය ලැබ අනුභව කරන්නාහු(වෙති),**ඉදම්පි සංඝේ රතනං පණීතං** - මෙය ද සංඝයා කෙරෙහි ප්‍රණීත වූ රත්න භාවයෙකි.**ඒතේන සච්චේන සුවත්ථි හෝතු** - මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යම් රහත් කෙනෙක් ගෞතම ශාසනයෙහි මනා කොට යෙදුනාහු ස්ථිර සිතින් සියලු කෙළෙසුන් ගෙන් නික්මුණාහු ද, ඔවුහු නිවකට බැස ඵල සමවත් සුවය ලැබ අනුභව කරන්නාහු පැමිණිය යුතු රහත් ඵලයට පැමිණියාහු වෙති. මෙය ද සංඝයා කෙරෙහි ප්‍රණීත වූ රත්න භාවයෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

**8. යථින්ද ඛීලෝ පඨවිංසිතෝ සියා - චතුබ්භිවාතේහි අසම්පකම්පියෝ තථූපමං සප්පුරිසං වදාමි - යෝ අරියසච්චානි අවෙච්ච පස්සති ඉදම්පි සංඝේ රතනං පණීතං - ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**යථින්ද ඛීලෝ** - ඉන්ද්‍රඛීල නම් වූ කණුව යම් සේ,**පඨවිංසිතෝ සියා** - පොළොව ඇතුළට පිවිස සිටියේ,**චතුබ්භිවාතේහි** - සිවු දිගින් හමන සුළඟින්,**අසම්පකම්පියෝ** - සොළවාලිය නොහැකි වන්නේ ද?**තථූපමං සප්පුරිසං වදාමි** - ඒ සත් පුරුෂයා එබඳු ඉන්ද්‍රඛීලය හා සමාන කොට කියමි.**යෝ අරියසච්චානි අවෙච්ච පස්සති** - යමෙක් ආර්‍ය සත්‍යයන් නුවණින් බැස දකී නම්,**ඉදම්පි සංඝේ රතනං පණීතං** - මෙය සංඝයා කෙරෙහි ප්‍රණීත රත්න භාවයෙකි.**ඒතේන සච්චේන සුවත්ථි හෝතු** - මේ සත්‍ය බලයෙන් සත්ත්වයනට සෙත් වේවා.



ඉන්ද්‍රඛීල නම් වූ කණුව යම් සේ පොළොව ඇතුළට පිවිස සිටියේ සිවු දිගින් හමන සුළඟින් සොලවාලිය නොහැකි වන්නේ ද? යමෙක් ආර්‍ය සත්‍යයෙන් නුවණින් බැස දකී නම් ඒ සත් පුරුෂයා එබඳු ඉන්ද්‍රඛීලය හා සමාන කොට කියමි. මෙය සංඝයා කෙරෙහි ප්‍රණීත භාවයෙකි. මේ සත්‍ය බලයෙන් සත්ත්වයනට සෙත් වේවා.

**9. යේ අරිය සච්චානි විභාවයන්ත. - ගම්භීර පඤ්ඤේන සුදේසිතානි කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා - න තේ භවං අට්ඨමං ආදියන්ති - ඉදම්පි සංඝේ රතනං පණීතං - ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**යේ** - යමෙක්,**ගම්භීර පඤ්ඤේන** - ගැඹුරු නුවණ ඇති සර්වඥයන් වහන්සේ විසින්, **සුදේසිතානි** - මැනැවින් දේශිත, **අරිය සච්චානි** - ආර්‍යය සත්‍යයන්, **විභාවයන්ති** - තමනට ප්‍රකට කෙරෙත් ද?, **කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමන්තා** - ඔවුහු කිසිසේත් බොහෝ සේ පමා වුවත් - **න තෙ භවං අට්ඨමං ආදියන්ති** -අටවන භවයක් නම් නොගනියි (භව හතක් තුළ අර්හත් භාවයට පත් වේ). **ඉදම්පි සංඝේ රතනං පණීතං** - මෙය ද සංඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න භාවයෙකි,**ඒතේන සච්චේන සුවත්ථි හේතු** - මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යමෙක් ගැඹුරු නුවණ ඇති සර්වඥයින් වහන්සේ විසින් මැනවින් දේශිත ආර්‍ය සත්‍යයන්තමනට ප්‍රකට කෙරෙත් ද? ඔවුහු කිසිසේත් බොහෝ සේ පමා වූවෝ වෙත් ද, ඔවුහු අටවන භවයක් නම් නො ගනිති. මෙය ද සංඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න භාවයෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

**10. සහාවස්ස දස්සන සම්පදාය - තයස්සුධම්මා ජහිතා භවන්තිසක්කාය දිට්ඨි විචිකිච්ඡිතඤ්ච - සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි - චතුහපායේහිච විප්පමුත්තෝ - ඡඡාභිඨානානි අභබ්බෝකාතුං- ඉදම්පි සංඝේ රතනං පණීතං - ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**සහාවස්ස දස්සන සම්පදාය** - දර්ශන සමාප්තිය සමඟ ම, **සක්කාය දිට්ඨි** - තමාගේ යන හැඟීම නිසා ඇතිවන සක්කාය දිට්ඨිය ද, **විචිකිච්ඡිතඤ්ච** -කළ නොකළදෑ පිළිබඳ සැකය හෙවත් විචිකිච්ඡාව ද, **සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි** -නිවනට අදාළ වේ යැයි සිතා යම්කිසි බැසගත් ව්‍යාජ ප්‍රතිපදාවක් හෙවත් සීලබ්බත

පරාමාසයෙක් ඇත්නම් එය ද යන, **තයස්සුධම්මා ජහිතා භවන්ති** - සසරට බැඳ තබන බැමි හෙවත් සංයෝජන ධර්ම තුන ඔහු විසින් හරන ලද්දාහු වෙති.**චතූහපායේහිච විප්පමුත්තෝ** - හේ සතර අපායෙන් මිදුණේ ද වේ. **චඡාභියානානි අභබ්බෝකාතුං** - **පඤ්චානන්තරීය** කර්ම හා අන්‍ය ශාස්තෘවරයකු ඇදහීම ද කරන්නට සුදුසු නො වේ. **ඉදම්පි සංඝේ රතනං පණීතං** - මෙය සංඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න භාවයෙකි. **ඒතේන සච්චේන සුවත්ථි හෝතු** - මේ සත්‍ය බලයෙන් සත්ත්වයිනට සෙත් වේවා.

දර්ශන සමාප්තිය සමඟ ම සක්කාය දිට්ඨිය ද,විචිකිච්ඡාව ද යම්කිසි සීලබ්බත පරාමාසයෙක් ඇත්නම් එය ද යන සංයෝජන තුන ඔහු විසින් හරන ලද්දාහු වෙති. හේ සතර අපායෙන් මිදුනේ ද වේ. පඤ්චානන්තරීය කර්ම හා අන්‍ය ශාස්තෘවරයකු ඇදහීම ද කරන්නට සුදුසු නො වේ. මෙය සංඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න භාවයෙකි. මේ සත්‍ය බලයෙන් සත්ත්වයනට සෙත් වේවා.

**11. කිඤ්චාපි සො කම්මං කරෝති පාපකං - කායේන වාචා උද චේතසා වා - අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය - අභබ්බතා දිට්ඨ පදස්ස වුත්තා ඉදම්පි සංඝේ රතනං පණීතං - ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**සෝ** - ඒ සෝවාන් පුද්ගල තෙමේ, **කායේන වාචා උද චේතසා වා** - කයින්, වචනයෙන් හෝ සිතින්, **කිඤ්ඤාපි කම්මං කරෝති** - යම් කර්මයක් හෝ පවක් කෙරේ ද? **සෝ** - හෙතෙම, **තස්ස පටිච්ඡාදාය අභබ්බෝ** - එය සඟවා ලීමට නො හැක්කේ වෙයි. **දිට්ඨපදස්ස** - නිවන් දුටුවහු ගේ, **අභබ්බතා වුත්තා** - පව් සැඟවීමට නොහැකි යැයි කිය යි. **ඉදම්පිසංඝේ රතනං පණීතං** - මෙය ද සංඝයා කෙරෙහි ප්‍රණීත වූ රත්න භාවයෙකි. **ඒතේන සච්චේන සුවත්ථි හෝතු** - මේ සත්‍ය බලයෙන් සත්ත්වයනට සෙත් වේවා.

ඒ සෝවාන් පුද්ගල තෙමේ කයින්, වචනයෙන් හෝ සිතින් යම් පවක් කෙරේ ද? හෙතෙම එය සඟ වා ලීමට නොහැකි වෙයි. නිවන් දුටුවහු ගේ පව් සැඟවිය නො හැකි යැයි කිය යි. මෙය ද සංඝයා කෙරෙහි ප්‍රණීත වූ රත්න භාවයෙකි. මේ සත්‍ය බලයෙන් සත්ත්වයනට සෙත් වේවා.

**12.** **වනප්පගුම්බේයථා ඵුස්සිතග්ගේ - ගිම්හාන මාසේ පඨමස්මිං ගිම්හේ - තථූපං ධම්මවරං අදේසයි - නිබ්බාණගාමිං පරමං හිතාය - ඉදම්පි බුද්ධේරතනං පණීතං -**



**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**යථා** - යම් සේ, ගිම්හාන මාසේ - ග්‍රීෂ්ම ඍතුවේ පළමු වැනි බක් මසෙහි, **වනප්පගුම්බේ** - රුක් ලැහැබ්හි, **ඵුස්සිතග්ගේ** - පිපුණු අග ඇත්තේ වේ ද? **තථූපමං** - එබඳු උපමා ඇති, **නිබ්බානගාමිං** - නිවනට පමුණු වන, **ධම්මවරං** - උතුම් ධර්මයක්,**පරමං හිතාය** - පරම හිත සුව පිණිස, **අදේසයි** - දෙසී ය. **ඉදම්පි බුද්ධේ රතනං පණීතං** - මෙය බුදුරදුන් කෙරෙහි ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයෙකි. **ඒතේන සච්චේන සුවත්ථි හෝතු** - මෙම සත්‍ය බලයෙන් සත්ත්වයනට සෙත් වේවා.

ග්‍රීෂ්ම ඍතුවේ පළමු වන බක් මසෙහි රුක් ලැහැබ් යම් සේ පිපුණු අග ඇත්තේ වේ ද? බුදුරජ තෙම එබඳු උපමා ඇති නිවනට පමුණු වන උතුම් ධර්මයක් පරම හිත පිණිස දෙසී ය. මෙය බුදුරදුන් කෙරෙහි ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයෙකි. මෙම සත්‍ය බලයෙන් සත්ත්වයනට සෙත් වේවා.

**13.** **වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ - අනුත්තරෝ ධම්මවරං අදේසයි - ඉදම්පි බුද්ධේ රතනං පණීතං - ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**වරෝ** - උතුම් වූ,**වරඤ්ඤූ** - නිවන දෙන්නා වූ,**වරදෝ වරාහරෝ** - නිවන ගෙනදෙන,**අනුත්තරෝ** - අනුත්තර වූ,**ධම්මවරං** - උතුම් ධර්මයක්,**අදේසයි** - දෙසී ය.**ඉදම්පි බුද්ධේ රතනං පණීතං** - මෙය ද බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයෙකි.**ඒතේන සච්චේන සුවත්ථි හෝතු** - මේ සත්‍යය බලයෙන් සත්ත්වයිනට සෙත් වේවා.

උතුම් වූ නිවන දෙන්නා වූ ශ්‍රේෂ්ඨ වූ බුදුරජාණන් වහන්සේ උතුම් ධර්මයක් දෙසූ සේක. මෙය ද බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රේෂ්ඨ වූ රත්න භාවයෙකි. මේ සත්‍ය බලයෙන් සත්ත්වයිනට සෙත් වේවා.

**14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං - විරත්ත චිත්තා ආයතිකේ භවස්මිං - තේ ඛීණ බීජා අවිරූළ්හිච්ඡන්දා - නිබ්බන්ති ධීරා යථා යං පදීපෝ - ඉදම්පි සංඝේ රතනං පණීතං - ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

**ඛීණං පුරාණං** - (යම් කෙනකුගේ)පුරාණ කර්ම ගෙවී ගියේ ද,නවං **නත්ථි සම්භවං** - පහළ වන අලුත් කර්මයකුත් නැත් ද,

**ආයතිකේ භවස්මිං** - මතු භවයෙහි,**විරත්ත චිත්තා** - නො ඇලුණ සිත් ඇති, **තේ ධීරා** - ඒ ධෘතිමත් රහත් උතුමෝ,**ඛීණ බීජා** - ක්ෂය කළ ප්‍රතිසන්ධි විඥාන බීජ ඇති,**අවිරූළ්හිච්ඡන්දා** - වැඩෙන ඡන්දයක් නැති,**යථා යං පදීපෝ** - යම් සේ මේ නිවුණු පහන් මෙන්,**නිබ්බන්ති** - පිරි නිවෙති.**ඉදම්පි සංඝේ රතනං පණීතං** - මෙය ද සංඝයා කෙරෙහි උතුම් භාවයෙකි.**ඒතේන සච්චේන සුවත්ථි හෝතු** - මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

යම් කෙනකුගේ පුරාණ කර්ම ගෙවී ගියේ ද, පහළ වන අලුත් කර්මයකුත් නැත් ද, මතු භවයෙහි නො ඇලුණු සිත් ඇති ක්ෂය කළ ප්‍රතිසන්ධි විඥාන බීජ ඇති වැඩෙන ඡන්දයක් නැති ඒ ධෘතිමත් රහත්හු මේ නිවුණු පහන් මෙන් පිරිනිවෙති. මෙය ද සංඝයා කෙරෙහි උතුම් රත්න භාවයෙකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

**පහත 15, 16, 17 ගාථා තුන ශක්‍ර දේවේන්ද්‍රයා විසින් කියන ලදී.**

**15. යානීධ භූතානි සමාගතානී - භුම්මානි වා යානිව අන්තලික්ඛේ - තථාගතං දෙව මනුස්ස පූජිතං - බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු**

**යානි** - යම්, **ඉධ** - මෙහි, **භූතානි** - අමනුෂ්‍ය කෙනෙක්, **සමාගතානි** - රැස් වූවාහු වෙත් ද, **භුම්මානි වා** - භූමියෙහි උපන්නා වූ හෝ, යානිව - යම්, **අන්තලික්ඛේ** - අහසෙහි හෝ (ඒ අපි), **තථාගතං** - තථාගතයින් වහන්සේ, **දේව මනුස්ස පූජිතං** - දෙව් මිනිසුන් විසින් පුදන ලද්දේ ය, **ධම්මං නමස්සාම** - ධර්මයට නමස්කාර කරමු - **සුවත්ථි හෝතු** - (මේ සත්‍ය බලයෙන්) සෙත් වේවා!

පොළොවෙහි උපන් හෝ අහසෙහි උපන් හෝ මනුෂ්‍ය කෙනෙක් මෙතැන්හි රැස් ව සිටිත් ද, ඒ අපි දෙව් මිනිසුන් විසින් පුදන ලද බුදු රදුන් වඳිමු.(මේ සත්‍ය බලයෙන්) සෙත් වේවා!

**16. යානීධ භූතානි සමාගතානී - භුම්මානි වා යානිව අන්තලික්ඛේ - තථාගතං දෙව මනුස්ස පූජිතං - ධම්මං නමස්සාම සුවත්ථි හෝතු**

**යානි** - යම්, **ඉධ** - මෙහි, **භූතානි** - අමනුෂ්‍ය කෙනෙක්, **සමාගතානි** - රැස් වූවාහු වෙත් ද, **භුම්මානි වා** භූමියෙහි උපන්නා වූ හෝ, **යානිව** - යම්, **අන්තලික්ඛේ** - අහසෙහි හෝ (ඒ අපි), **තථාගතං** - තථාගතයින් වහන්සේ, **දේව මනුස්ස පූජිතං** - දෙව් මිනිසුන් විසින් පුදන ලද්දේ ය, **ධම්මං නමස්සාම** - ධර්මයට නමස්කාර කරමු - **සුවත්ථි හෝතු** - (මේ සත්‍ය බලයෙන්) සෙත් වේවා!

පොළොවෙහි උපන් හෝ අහසෙහි උපන් හෝ මනුෂ්‍ය කෙනෙක් මෙතැන් හි රැස් ව සිටිත් ද, ඒ අපි දෙව් මිනිසුන් විසින් පුදන ලද ධර්මයට නමස්කාර කරමු. (මේ සත්‍ය බලයෙන්) සෙත් වේවා!

**17. යානීධ භූතානි සමාගතානී - භුම්මානි වා යානිව අන්තලික්ඛේ - තථාගතං දෙව මනුස්ස පූජිතං - සංඝං නමස්සාම සුවත්ථි හෝතු**

**යානි** - යම්, **ඉධ** - මෙහි, **භූතානි** - අමනුෂ්‍ය කෙනෙක්, **සමාගතානි** - රැස් වූවාහු වෙත් ද, **හම්මානි වා** - භූමියෙහි උපන්නා වූ හෝ, **යානිව** - යම්, **අන්තලික්ඛේ** - අහසෙහි හෝ (ඒ අපි), **තථාගතං** - තථාගතයින් වහන්සේ, **දේව මනුස්ස පූජිතං** - දෙව් මිනිසුන් විසින් පුදන ලද්දේ ය, **සංඝං නමස්සාම** - සංඝරත්නයට නමස්කාර කරමු - **සුවත්ථි හෝතු** - (මේ සත්‍ය බලයෙන්) සෙත් වේවා!

පොළොවෙහි උපන් හෝ අහසෙහි උපන් හෝ මනුෂ්‍ය කෙනෙක් මෙතැන්හි රැස් ව සිටිත් ද, ඒ අපි දෙව් මිනිසුන් විසින් පුදන ලද ශ්‍රාවක සංඝයා වඳිමු. (මේ සත්‍ය බලයෙන්) සෙත් වේවා!

උදේ සවස උවදුරු දුරු කර ගැනීම සඳහා භාවිත කළ යුතු උතුම් සෙත් පිරිතකි. රතන සූත්‍රයේ ඒ ඒ කොටස් ගෙන මැතිරීමෙන්, ජප කිරීමෙන් සතුරු කරදර, රෝග පීඩා, අණ වින, වසංගත රෝග, යක්ෂ ප්‍රේත භය දුරු වේ. සතුන්ගෙන් හෝ කෘමීන්ගෙන් වගාවන්ට සිදුවන හානි වැළැකේ.

ඔබට උතුම් තුනුරුවන් ආනුභාවයෙන් සෙත් වේවා

**සාදු! සාදු!! සාදු!!!**

# කරණීයමෙත්ත සූත්‍රය

කරණීයමෙත්ත සූත්‍රය (මෙත්ත සූත්‍රය) බෞද්ධයින් අතර ආරක්ෂක පිරිතක් ලෙස ද භාවනා ධර්මයක් ලෙස ද ඉතා ප්‍රකට ය. තුන් සූත්‍රය ලෙස මහා මංගල සහ රතන සූත්‍රය සමග භාවිත වන්නක් වීමෙන් පිරිත් දේශනාවන්හි නැති ව ම බැරි අංගයක් වන මෙත්ත සූත්‍රය එහි පදයෙන් පදය අර්ථයත් සමඟ දහම් කැමැති ඔබ අතට පත් කිරීමට මෙසේ අදහස් කරමි. මේ සූත්‍ර දේශනාව කුඩා කල පටන් අසන අප එහි අරුත දැන සිටීම වටින්නේ ය. මෙය ඛුද්ධක නිකායේ ඉතා පැරණි ම ශ්‍රී මුඛ දේශනා සංගෘහිත සුත්ත නිපාතයේ ඇතුළත් දේශනාවකි.

**නිධාන කතාව:**

බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර වැඩ වාසය කරන සමයෙක පන්සියයක් භික්ෂූන් වහන්සේලා සුදුසු කමටහන් ලබාගෙන වස් තුන් මස විවේකී ව බවුන් වැඩීමේ අදහසින් සුදුසු තැනක් සොයා පිටත් ව ගියහ.

උන්වහන්සේලා එක්තරා ගමකට වැඩ ම කළ අවස්ථාවේ දීඑහි වාසය කළ මිනිස්සු උන්වහන්සේලාගේ අදහස දැන ගෙන ගම අසල ඇති වන ලැහැබක් ඇතිබවත් එය භාවනාවට සුදුසු බවත් දන් වා සිටියහ. ගමට ඉතා ආසන්න නො වී, ඉතා දුරින් ද නො පිහිටි වන ලැහැබක් බැවින් භික්ෂූන් වහන්සේලාත් ඒ වන ලැහැබට වැඩම කර තම භාවනා කර්මය පටන් ගත්හ.

මේ වන ලැහැබට අරක් ගත් රුක්ෂ දේවතාවුන් සමූහය මේ සිල්වත් භික්ෂූන් වහන්සේලා බිම හිඳිද්දී තමන් උඩ හිඳීම නුසුදුසු යැයි සිතා බිමට බැස්සාහ. ඊළඟ දිනයේත් පිඬු සිඟා වැඩීමෙන් පසු උන්වහන්සේලා පැමිණීමෙන් දේවතාවුනට බිමට බැසීමට සිදු විය. මේ ආකාරයට දින කිහිපයක් ගත වීමෙන් පසු දේවතාවුනට පෙනී ගියේ මේ යෝගාවචර සඟ පිරිස දිගු කලක් නැවතී සිටිනු ඇති බව ය.

ඔවුහු කතිකා කර භික්ෂූන් වහන්සේලා බිය ගන් වා එළවා දැමීමට උපක්‍රම යෙදූහ. දේවතාවුන් විසින් අමනුෂ්‍ය රූප මළ කඳවල් ආදී බියජනක දෑ මවා පෙන් වීමෙන් ඒ ස්වාමීන් වහන්සේලාගේ බවුන් වැඩීමට බාධා කළහ. උන්වහන්සේලාගේ



ශරීර සුදුමැලි ව බියෙන්තැති ගැනුණාහ. සිත් එකඟ කළ නොහැකි ව භාවනා අසාර්ථක විය. නමුත් උන්වහන්සේලා කිසිදු හේතුවක් නිසාවත් නිහඬභාවය නොබිඳීමේ අධිෂ්ඨානයෙන් සමාදන් වූ මුනිවත රැකීම හෙවත් මෞන ව්‍රතය සමාදන්ව සිටිය නිසා කිසිවෙක් මේ පිළිබඳව කථා නොකළාහ.

දිනක් පැන් ගෙන ඒමටදිය කඩිත්තට ගිය අවස්ථාවේ සංඝ ස්ථවිරයින් වහන්සේ තමන් වහන්සේ මෙන් සෙසු භික්ෂූන් ද ශරීරයෙන් කෘෂ ව වැහැරී සිටිනු දැක මුවින් වචනයක් පිට නොකර සිටීම එතෙකින් නවතා අනෙකුත් ස්වාමීන් වහන්සේලාගෙන් මේ ගැන විමසා බැලූහ.

"කිමෙක් ද ඇවැත්නි, ඔබ වහන්සේලා ශරීරයෙන් කෘෂ වසුදුමැලි බවට පත් වූයේ කිනම් කරුණකින් දැ" යි විමසූහ.

ඒ විට තමන් වහන්සේට සේ ම සද්ධවිහාරික අනෙකුත් භික්ෂූන් වහන්සේලාට ද ඇත්තේ අමනුෂ්‍ය කරදර බව දැන එතැන තමනට භාවනාවට සුදුසු තැනක් නොවන්නේ යැයි සිතූ උන්වහන්සේ පෙරළා බුදුන් වහන්සේ වෙත පැමිණියහ. පැමිණ තම අත්දැකීම සැල කළහ.

"ස්වාමීනී, මේ විදියේ උපද්‍රවවලට මුහුණ දෙන්න වුණු එම සෙනසුන බවුන් වැඩීමට සුදුසු නැති බව යි පේන්නෙ."

"මහණෙනි, මං ආයුධයක් දෙන්නම්, ඒකත් අරන් නැවතත් ඒ කැලේටම යන්න."

"ස්වාමීනී, කුමක් ද ඒ ආයුධය?"

ඒ ආයුධය තම යි කරණීය මෙත්ත සූත්‍රය. මේ දේශනාව ඉගෙන ගොස් මසකට අට වරක් බණ අසන දිනයන් හී දී සජ්ඣායනා කරන්න.මෙය පදනම් කර ධර්මසභාව රැස් වන්න.මෙය කර්මස්ථානයක් ලෙස වඩින්නැ යි" අවවාද දී කරණීය මෙත්ත සූත්‍රය දේශනා කළ සේක.

මේ උපදෙස් අනුගමනය කළ එම භික්ෂූන් වහන්සේලා නැවත එම ගම් පෙදෙසට හා වනාන්තරයටම වැඩම කළහ. මෛත්‍රී චිත්තයන් විහිදුවා වාසය කරන භික්ෂූන් වහන්සේලා අභිබවා යන්නට දෙවියනට නොහැකි විය. දෙවිවරු තමනට ලැබී ඇත්තේ උතුම් භාග්‍යයකැයි සිතා මනුෂ්‍යය වේසයෙන් ගමට ගොස් මේ භික්ෂූන් වහන්සේලාට මෙසේ සත්කාර කරන්නැයි කියමින් ගම්වැසියෝ උනන්දු කරමින් භික්ෂූන් වහන්සේලාට උපස්ථාන

කරන්නට පටන් ගත්හ. දේවතාවුනගේ හිරිහැර නැති වී ගොස් නිතිපතා දේව්දේවතාවුනගේ ද උපකාර ලැබ භාවනා කිරීමෙන් වස් තුන් මස අවසානයේ දී උන්වහන්සේලා පන්සිය නමම අර්හත් ඵල සමාප්තියට පත් ව උත්තරීතර නිවන් අවබෝධයෙන් සැනසිල්ල උදා කර ගත්හ.

## කරණීයමෙත්ත සූත්‍රයේ අර්ථය පදයෙන් පදය

**කරණීයමත්ථ කුසලේන** (=කරණීය+අත්ථ) - තමාට අර්ථයක් හෙවත් යහපතක් කර ගන්නකු විසින්,

**යං තං සන්තං පදං අභිසමෙච්ච** - ඒ ශාන්ත පදය (නිවන) අවබෝධයෙන්,

**සක්කෝ** - දක්ෂයෙක්,

**උජූ ච** - ඍජු/අවංක (වූවෙක්),

**සුජූ ච** - වඩාත්/තමාට සිතින් පවා අවංක (වූවෙක්),

**සුවචෝ වස්ස** - කීකරු වූවෙක්,

**මුදු** - මෘදු මෙළෙක් ගුණ දනවන,

**අනතිමානී** -නිහතමානී (වූවෙක් විය යුතු ය.)

**සන්තුස්සකෝ ච** - ලද දෙයින් සතුටු වන,

**සුභරෝ ච** - පහසුවෙන් රැකිය හැකි,

**අප්ප කිච්චෝ ච** - අල්ප වූ වැඩ කටයුතු ඇති,

**සල්ලහුක වුත්ති** - ලහුක ( හෙවත් සැහැල්ලු) පැවතුම් ඇති,

**සන්තින්ද්‍රයෝ ච** - සන්සුන් (පස්) ඉඳුරන් ඇති,

**නිපකෝ ච** - ඥානවන්ත වූ,

**අප්පගබ්භෝ** - (ප්‍රගල්භ නොවන හෙවත්) සැහැසි/රළු නො වූ,

**කුලේසු අනනුගිද්ධෝ** - කුලයන්හි නොඇලුණු (හෙවත් තමාට උපකාරීයැයි සිතා නොයෙක් හිතවත් පවුල්වලට නොඇලුණු අයකු විය යුතු ය.)

**න ච බුද්දං සමාචරේ** - කුඩා වූත් සම වූත්,

**කිඤ්චි යෙන විඤ්ඤූ පරේ** - කිසියම් ඒ වෙනත් නුවණැති අයෙකු විසින්,

**උපවදෙය්‍යුං** - ගැරහීමට ලක් විය හැකි කටයුතු නොකර සිටින්නෙකි.



**සුඛිනෝ වා** - (තමා ඇතුළු සියලු සත්ත්වයෝ)සැපයට පත් වෙත්වා!,

**ඛේම්නෝ හෝන්තු** - (තමා ඇතුළු සියලු සත්ත්වයෝ සිතිනුත්)නිදහස් නොබිය වූවෝ වෙත්වා!,

සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා - සියලු සත්ත්වයෝ සුවපත් වේවා!

**යේ කේචි පාණ භූතත්ථි** - යම් තාක් පණ ඇතියවුන් සිටින්නේ නම්,

තසා වා - තැති ගත් හෝ,

**ථාවරා වා** - ස්ථාවර හෙවත් තැති නො ගත් (අර්හත්ඵල සමාප්තියට පැමිණි උතුමන් තැති නො ගත් යන්නෙන් අදහස් වේ/ එසේ නොමැති නම් ස්ථාවර යන්නෙන් බොහෝකල් පවතින හෝ නොසෙල්විය හැකි යන්න අදහස් වේ).

**අනවසේසා** - ඉතුරු නැති ව ම,

**දීඝා වා** - දිග් වූ හෝ,

**යේ මහන්තා වා** - මහත් වූ,

**මජ්ඣිමා** - මධ්‍යම ප්‍රමාණ වූ,

**රස්සකා** - කෙටි ප්‍රමාණ වූ,

**(අ)ණුක** - ඉතා සියුම් වූ,

**ථූලා**- ස්ථුල වූ,

**දිට්ඨා වා** - දුටු සත්ත්වයින් හෝ,

**යේව අද්දිට්ඨා** - යම් නුදුටු සත්ත්වයින් ද,

**යේ ච දූරේ** - යම් දුර සිටින සත්ත්වයින් හෝ,

**වසන්ති අවිදූරේ** - නුදුරේ හෙවත් ආසන්නව ප්‍රදේශවල වසන සත්ත්වයින්,

**භූතා වා** - හටගත් හෙවත් ඉපදුණු හෝ,

**සම්භවේසී වා** - නො ඉපදුණු, (මවු කුස සිටින හෝ බිත්තර අවස්ථාවේ සිටින හෝ),

**සබ්බේ සත්තා භවන්තු සුඛිත්තා** - සියලු සත්ත්වයෝ සුවපත් (සිතැති) වේවා!

**න පරෝ පරං නිකුබ්බේථ** - එකකු තවකකුට වංචා නො කෙරේ වා!

**නාතිමඤ්ඤේථ** (=න+අතිමඤ්ඤේථ)- හෙළා නො දකිත් වා!

**කත්ථචි නං කිඤ්චි** - කොතැන කිසිවකුත්,

**බ්‍යාරෝසනා** - කෝප වී,

**පඨීඝ සඤ්ඤා** - ගැටෙන අදහසින්,

**නාඤ්ඤමඤ්ඤස්ස** - එකකු අනෙකකුට,
**දුක්ඛමිච්ඡෙය්‍ය** - දුකකැමැති වන්නේ නැත,
**මාතා යථා** - යම් මවක්,
**නියං පුත්තං** - තමාගේ පුතු,
**ආයුසා** - පණ වැනි ව,
**ඒක පුත්තමනුරක්ඛේ** - එක ම පුතාරැකගනියි ද (එනම් මේ මගේ එකම පුතා යැයි සිතා සියලු සත්ත්වයන් වෙත මවක් මෙන් මෙත් සිත යොමු කිරීමයි),
**එවම්පි** - එලෙස ම,
**සබ්බ භූතේසු** - සියලු සත්ත්වයිනට,
**මානසං භාවයේ අපරිමාණං** - අපරිමිත වූ මනසක් වැඩි ය යුතු ය.
**මෙත්තං ච සබ්බ ලෝකස්මිං** - සකල ලෝකය වෙත මෙත පතුරු වා,
**මානසං භාවයේ අපරිමාණං** - අපරිමිත වූ මනසක් වැඩිය යුතු ය.
**උද්ධං** - උඩ ද,
**අධෝ ච** - යට ද,
**තිරියං ච** - හරහට/දිසානුදිසාවන් ද,
**අසම්බාධං** - බාධා නැති ව,
**අවේරං** - අවෛරී ව,
**අසපත්තං** - කොයි දිසාවකවත් සතුරෙක් යන හැඟීම ඇති අයෙක් සිතෙහි තබා නොගෙන,
**තිට්ඨං** - හිට ගෙන සිටිද්දී හෝ,
**චරං** - ඇවිදින විට හෝ,
**නිසින්නෝ වා** - ආසනයක හිඳ ගෙන සිටින විට හෝ,
**සයානෝ වා** - සයනය කරමින් හෝ,
**යාවතස්ස විගතමිද්ධො** - නින්දෙන් වෙන් ව සිටින තාක් හෙවත් අවදියෙන් සිටින සෑම විට ම,
**ඒතං සතිං අධිට්ඨෙය්‍ය** - මෙසේ සිහිය අදිටන් කොට ගත යුත්තේ ය.
**බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු** - මෙසේ විසීම බ්‍රහ්ම විවරණයකැ යි ලොව (නුවණැත්තෝ) කියත්.
**දිට්ඨිංච අනුපගම්ම** - (සත්ත්වයෙක් පුද්ගලයෙක් සිටිත් යන) දෘෂ්ටියට නො ගොස්,
**සීලවා** - (සිදුරු නැති ව)සිල්වත් වන්නේ,
**දස්සනෙන සම්පන්නො** - නිවැරදිව උතුම් ඇත්ත හතර පිළිබඳව



දැක්මෙන් යුතු ව,
**කාමෙසු විනෙය්‍ය ගෙධං** - පංචකාමයන් කෙරෙහි ගිජු බව හෙවත් ඇලෙන ස්වභාවය හා ගැටෙන ස්වභාවය දුරු කොටගෙන (හෙවත් මෙසේ පුහුණු වීම තුළින් අනාගාමී ආර්ය උතුමෙකු වී),
**න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති** -කාමයන් කෙරෙහි තිබෙන කැමැත්ත හෝ අකමැත්ත දුරුකොට ඇති බැවින් කාමයන් සොයා නැවත උපතක් බලාපොරොත්තුවෙන් මවු ගැබක පිළිසිඳගැනීමට නො පැමිණෙන්නේ ම ය.

සියලු සත්ත්වයෝ සුවපත් වෙත් වා!!!

මේ අනර්ඝ සූත්‍ර දේශනාවේ මෙත් වැඩීමේ උපදෙස් මාලාවක් ඇතුළත් වන අතර, එම බුද්ධ වචන භාවනා කර්මයක් දක් වා පහසුවෙන් වැඩීමට ඔබටත් හැකි ය. නිවෙසේ දී පිරිත් කියන විට ඔබ අර්ථය බලමින් කියවා, මේ අර්ථ ඔබට හුරු කරවා ගෙන, නිතර මෙනෙහි කරන විට තම තමනටතමා විසින් ම ධර්මාවබෝධයක් සලසා ගත හැකි ය.

මේ සූත්‍රයේ අවසානයට සඳහන් වන පරිදි ඔබත් නැවත මවු කුසෙක පිළිසිඳ නො ගැනීමට භාවනා වීර්යය උපද වන්නේ නම් මේ ඔබට සුදුසුම සූත්‍ර දේශනාව යි. මෛත්‍රිය වඩනවිට ඉක්මනින් සිත සමාධිගතවන්නේ යැයි මෙත්තානිසංස සූත්‍රයේ ආනිශංස එකොළහෙන් එකක් ලෙස සඳහන් වේ.

මෛත්‍රී සිතින් වාසය කිරීමෙන් ඔබට නිරන්තර ආරක්ෂාව ලැබෙනු ඇත. එසේ වන්නේ ඔබේ මෛත්‍රී චිත්තයේ මහිමයෙන් සලිත වී යන අමනුෂ්‍යයන් ඔබට කරදර නො කොට, පිං බලාපොරොත්තුවෙන් ඔබ ආරක්ෂා කිරීමට පෙළැඹෙන නිසා ය. දෙවියෝ ද ඔබ උපද්‍රවවලින් වළක්වනු ඇත.
ඔබේ සිත ද සැමට සුව සලසන මෛත්‍රී පිණ්ඩයක් වේවා! මේ දිනූ මනුෂ්‍ය ජීවිතයේ දී ම ධර්ම ප්‍රාර්ථනා සමෘද කොටගෙන ශාන්ත ලක්ඛණ අමා නිවනින් සැනැසීම උදා කර ගැනීමට මේ මහඟු බුද්ධ වචන ඔබට නිතිපතා උපකාරී වේවා!

**සාධු! සාධු!! සාධු!!!**

# මෛත්‍රීභාවනාවෙන් නිවන් අවබෝධ කළ හැකි ද?

මෛත්‍රීභාවනාවෙන් නිවන් අවබෝධ කළ නොහැකියැයි දුර්මතයක් සමාජයේ ගිහි පැවිදි දෙපාර්ශවය තුළම පවතී. මෙය කෙසේ වටහා ගත යුතු ද ? මෙබඳු පැනයකට උපකාර කරගත හැකි සූත්‍ර දේශනා බොහෝ වශයෙන් සූත්‍ර පිටකයේ සඳහන් වේ.

සංයුත්ත නිකායේ බොජ්ඣංග සංයුත්තයේ සාකච්ඡා වග්ගයේ සඳහන්වන **මෙත්තාසහගත** සූත්‍රයට අනුව බොජ්ඣංග ධර්ම[1] වඩමින් මෛත්‍රී සිත පැතිරවීමෙන් සිත ඉතා ප්‍රසන්න වී අප්‍රසන්න දේ තුළ පවා ප්‍රසන්න ලෙස සිතින් අරමුණු කිරීමේ හැකියාව ඇති වන බවත් එයින් **සුභ විමොක්ඛය** ලබන බවත් සඳහන් වේ. එපමණට වැඩුණු සිත පැවතිය හැක්කේ සිවුවැනි ධ්‍යානය ආශ්‍රිතවය. එබඳු මෘදු මොළොක් මෙත් සිතක් වැඩූ පසු එම සිත පරිවර්තනයකට බඳුන් වේ. එනම් එසේ වැඩුණු සිතක් යනු කරුණා සහගත සිතක් යන බව යි.

එම සූත්‍රදේශනාවේම සඳහන්වන පරිදි බොජ්ඣංග ධර්ම වැඩීම කරුණා සිත ඔස්සේද සිදුකරගෙන යයි. කරුණා සහගත සිත සියලු සත්ත්වයන්ට පැතිරවීමෙන් සීමාවක් නැතිව සිත පැතිර ආකාසය අනන්ත යැයි ආකාසානඤ්චායතනය යන අරූප[2] සමාපත්තියට සමවදී. එබඳු සිතක් අසීමිත ප්‍රීතියකින් ඔදවැඩී යයි. එම සිත මුදිතා සිත වශයෙන් හඳුන්වා ඇත. මුදිතා සිත සියලු දිසාවන්ට පැතිරවීමෙන් අනන්ත විඤ්ඤාණය යන සමාපත්තිය තුළ සිත ඇලේ. මෙය විඤ්ඤාණඤ්චායතනය ලෙස ප්‍රකටව හඳුන්වනු ලැබේ. මෙසේ පැතිර වූ සිත අධික උපෙක්ෂාවකට යෝග්‍යය. උපේක්ෂාව යනු සැප දුක් වශයෙන්

---

**1 බොජ්ඣංග ධර්ම සතකි. එනම් සිහිය, ධර්ම සංසිද්ධීන් විචාරීම, අවශ්‍යය පමණට වීර්යය පවත්වා ගැනීම, ප්‍රීතියෙන් යුතු බව, පස්සද්ධි ස්වභාවය, සමාධිය සහ සුඛ දුක්ඛ ආදී දැනීම් නැති උපේක්ෂා සිත යන ධර්ම හතයි. මෙහි මධ්‍යයයේ සඳහන් ප්‍රීතිය යන බොජ්ඣංගය අනෙක් සියලු බොජ්ඣංග ධර්ම සමබරව පවත්වා ගැනීමට උපකාරී කරන ධර්මතාවයකි.**



**2 අරූප යනුවෙන් හඳුන්වනුයේ ඇස ආදී ඉන්ද්‍රියවලට ගොදුරුවන චක්ඛු රූප ආදී රූප පිළිබඳ සිත නොඇලවන බැවිනි.**

විඳීම් අරමුණු ඉක්මවා ගිය ඉතා සියුම් චිත්ත ස්වභාවයකි. මෙත්තාසහගතසූත්‍රදේශනාවට අනුව එබඳු සිත කිසිවක් **නැත්තේයයන සඤ්ඤාව අරමුණු කොට ආකිඤ්චඤ්ඤායතනයට බැස වාසය කරයි.**

මෛත්‍රිය, කරුණාව, මුදිතාව සහ උපේක්ෂාව එපමණකට වැඩූ සිතක් ඉතා බලවත් සිතකි. එයින් පසුවට ඇත්තේ සඤ්ඤා වශයෙන් ගැනීමට තරම් කිසිවක් ඇත්තේද නැති නැත්තේද නැති ඉතා සියුම් චිත්ත ස්වභාවයකි. එය **නේවසඤ්ඤානාසඤ්ඤායතනය** යි. එවන් චිත්ත ස්වභාවයක් පිළිබඳව ද නොඇලී වාසය කරන සිතකට අල්ලා ගැනීමට කිසිවක් නොමැති තැන නිරෝධ වී යයි. තමා යැයි සිතා සිටි පැවැත්ම මෙයින් බිඳේ. සැකය දුරු වේ. වෙනත් වෘත අනුගමනයෙන් වැළකේ. සංයෝජන සියල්ල දුරු වේ. සඥ්ඥා නොමැති තැන විඳීම් නොමැති වී විඤ්ඤාණයට පැවැත්මක් නැතිවන බැවින් මෙම තත්ත්වය **සඥ්ඥා-වේදයිත-නිරෝධය** යැයි ධර්මයේ සඳහන් වේ. මෙම නිරෝධය තුළට බැස ගන්නෙකු ඊට පෙර හෝ ඒ තුළදී හෝ ඒ පිළිබඳ කිසිවක් නොදනී. මොහොතක මිදීමක් වුවද එය අසීමිත සහනයකි. ඒ සමගම සිතේ ඇති වීමත් නැතිවීමත් දැකීමෙන් හේතු ඵල ධර්මතා ඉතා පැහැදිලිව අවබෝධ වේ.

සඥ්ඥා-වේදයිත-නිරෝධයෙන් මිදුණු විට නැවත කෙළෙස් පහලවීමක් නැත්තේ යැයි ඤාණයක් පහළ වේ. එතෙක් නිවන තහවුරු වන්නේ නැත. තමා කළ යුත්ත කළේ යැයිද නැවත කෙළෙස් පහළ වීහක් නැත්තේ යැයි ද තමා විසින්ම අවබෝධ කරගන්නේ එම ප්‍රඥා ඇසිනි. ඒ රහත් ඵල අවස්ථාවයි.

අප මෙතෙක් සාකච්ඡා කළ සූත්‍රවලට අනුව ධර්ම මාර්ගය නිවැරදි අවබෝධයෙන් තමා අසා ඇති ධර්මතා සියල්ල උපයෝගී ගරගනිමින් පුහුණුවන ධර්මාවබෝධය ඇති පුද්ගලයා මෛත්‍රී චිත්තය වඩමින් කාමයන්ගේ ආදීනව දැක කාමයන්ගේ ගිජුබව දුරු කොට (**කාමේසු විනෙය්‍ය ගේධං**) නැවත මවුකුසක පිළිසිඳගැනීමට නොපැමිණෙයි (**නහි ජාතු ගබ්භ සෙය්‍යං පුනරේති**) යන කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් ස්වභාවය කුමක්ද?. ඒ අනාගාමී ආර්ය

පුද්ගල තත්ත්වය යි. යථෝක්ත ආර්ය පුද්ගල අවස්ථාවට පූර්ව අවස්ථාව යි.

එසේ නම් මෛත්‍රී භාවනාව නිවනට උපකාරී නොවන්නේ යැයි කිව හැක්කේ කා හටද? එය හුදෙක් දුර්මතයක් පමණි. භාවනාව මනාකොට නොවඩා සූත්‍රවලට අටුවා ලිවීමට ගොස් සද්ධර්මය විකෘති කළ ඉන්දියාවෙන් පැමිණි බමුණු අටුවාචාරීන් වහන්සේ නමකගේ මතයක් පමණි. ඒවා සමාජගත වී සියවස් ගණනාවක් ගොස් ඇති බැවින් බොහෝ දෙනෙක් මෛත්‍රීභාවනාව වඩන්නේ ඉතා ප්‍රකට භාවනා ක්‍රමයක් ලෙස වඩන ආනාපානසති භාවනාව වැඩීම ආරම්භ කිරීමට උපකාරයක් වශයෙනි.

නමුත් වඩා විමසිල්ලෙන් සූත්‍ර පිටකය පිරික්සා බලන ඕනෑම අයෙකුට වැටහෙන දෙයක් ඇත. එනම්, බුදු රජාණන් වහන්සේ වැඩිපුරම දේශනා කොට ඇත්තේ සතර බ්‍රහ්ම විහරණ පිළිබඳව බවත් ආනාපානසතිය හුදු එක් භාවනාවක් ලෙස කොතැනකවත් දේශනා කොට නැති බවත් ය. බුදුන් වහන්සේ පවා නිරන්තරම කරුණා සමාපත්තිය තුළ සිත පිහිටා වාසය කළ බවත් සූත්‍රවලින් ප්‍රකට වේ.

ආනාපානසතිය පිළිබඳව දේශනාකර ඇති සතිපට්ඨාන, ආනාපානසති ආදී මජ්ඣිම නිකායාගත සූත්‍රවලට අනුව බුදුන් වහන්සේ ආනාපානසතිය දේශනා කොට ඇත්තේ කායානුපස්සනාවේ එක් අංගයක් ලෙස පමණි. සතර සතිපට්ඨානයම එක්වර නොවඩන්නේ නම් එම සූත්‍රවලට අනුව අවුරුදු හතකින් ඔබ්බට භාවනා වැඩුවත් පළක් ලැබෙන්නේ නැත.

ඇතැම් සූත්‍රවල සඳහන් වන්නේ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලට සම්මුඛව භාවනා උපදෙස් දුන් බවයි.අරිය **පරියේසන සූත්‍රයට** අනුව පස්වග මහණුන්ගෙන් දෙදෙනක් පිඬුපිණිස වැඩම කරද්දී බුදුන් වහන්සේ අනෙකුත් මහණුන්ට උපදෙස් දුන් බවක් සඳහන් වේ. මජ්ඣිම නිකායේ **සච්ච විභංග සූත්‍ර** දේශනාවට අනුව සැරියුත් තෙරුන් අන්‍ය භික්ෂූන් වහන්සේලා සෝවාන් ඵලයෙහි පිහිටුවන අතර මුගලන් තෙරුන් ඔවුන්ව එයින් එපිට ඵලයන්ට මෙහෙයවන බවත් සඳහන් වේ.[3] එම අවස්ථාවලදී ලබා දුන් උපදෙස් සූත්‍රවලින් දැකගත නොහැකිය. දින කිහිපයක භාවනා වැඩසටහන්වල දී සම්මුඛව අසනුයේ එබඳු ප්‍රශ්න විය හැකිය. එබැවින් ඔබ ධර්මාවබෝධය කැමැත්තේ නම් කළ යුත්තේ



කුසලච්ඡන්දය උපදවා හැකි පමණ භාවනා පුහුණු වැඩසටහන්වලට අවස්ථාව උදා කරගෙන විමසිලිමත් නුවණින් බවුන් වඩා භව චක්‍රයෙන් නිදහස් වීමයි.

සමථ-විපස්සනා නොමැතිව මෛත්‍රීභාවනාවෙන් පමණක් නිවන් අවබෝධ කරන්නේ කෙසේදැයි යම් කෙනෙකු ඇසුවහොත් එම ප්‍රශ්නයම වැරදි ප්‍රශ්නයකි. සමථ-විපස්සනා වශයෙන් භාවනාවෙහි බෙදීමක් බුදුරජාණන් වහන්සේගේ සූත්‍රවල නැත. බුදුරජාණන් වහන්සේ සීල ප්‍රතිපදාව, නීවරණාදී ධර්ම සහ කාමයන් අභිබවා ධ්‍යාන වැඩෙන අයුරු සඳහන්වන සමාධි ප්‍රතිපදාව, අනිත්‍යය, දුක්ඛ, අනාත්ම ලක්ෂණ, චතුරාර්ය සත්‍යය, හේතුඵල අනුව හටගැනීම හා නැතිවීම ආදී ධර්මය ඔස්සේ ප්‍රඥා පරිපාකත්වයට පත්වෙන අයුරු ද දේශනා කළහ. එබඳු ධර්මය අසා ඇති කෙනා ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයෙකි. සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ අංගයම මෛත්‍රී භාවනාව පූර්ව වූ බ්‍රහ්මවිහාර ප්‍රතිපදාවෙන් සම්පූර්ණ කෙරෙන බව ඉහත සාකච්ඡාවෙන් පැහැදිළි විය.

වරක් ගණක මොග්ගල්ලානයන්විසින් "කිමෙක්ද භවත් ගෞතමයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙපමණ අවවාද කරද්දී සියල්ලෝම ඒකාන්තයෙන් නිවනට පැමිණෙන්නේද" යනුවෙන් ඇසූ පැණයකට බුදුරජාණන් වහන්සේ දුන් පිළිතුර වූයේ "රජගහ නුවරට යනු කැමති පුද්ගලයෙන් පාර දැනගැනීමට කැමතිව නිවැරදිව පාර අසාදැනගත් නමුත් වැරදි පාරකින් වෙනත් දිශාවකට යන්නාක් මෙන්" මාර්ගය නිවැරදි අවබෝධයකින් තොරව අනුගමනය නොකරන කල්හි නිවනට යන මග අතහැරෙන බවයි. එවිට සතුටු වූ ගණක මොග්ගල්ලානයන් පැවසුවේ "සුවඳ මුල් අතරින් කලුවැල් අග්‍ර වන්නේ යම් සේක් ද, සුවඳ අරටුවලින් රත්සඳුන් අග්‍ර වන්නේ යම් සේක් ද, සුවඳ මල් අතරින් සමන් පිච්ච අග්‍ර

---

3ම.නි. 141: "සාරිපුත්තෝ භික්ඛවේ, සෝතාපත්ති ඵලේ විනේති. මොග්ගල්ලානෝ උත්තමත්ථේ"

වන්නේ යම් සේක්ද එසේම සියලු ධර්මයන් අතරින් බුදුරජාණන් වහන්සේගේ ධර්මය ශ්‍රේෂ්ඨ වන බවයි."එබැවින් මිත්‍යා ධර්මයන් පැතිර යා නොදී නිරවුල්ව ධර්ම මාර්ගය පුහුණුවීමට ඔබ නිතර ශ්‍රවණය කරන සූත්‍ර දේශනා වුවත් ප්‍රමාණවත් වේ. අවශ්‍යය වන්නේ කුශලය හා සත්‍යය ගවේෂණය (කිං කුසල ගවේසී - කිං සච්ච ගවේසී වීම) පමණි.

කෙසේ නමුත් වරක් භාවනානුයෝගී වයෝවෘද්ධ ස්වාමීන් වහන්සේ නමකගෙන් එකම පැනයක් අසන්නට ලද අවස්ථාවේදී **"ස්වාමීන් වහන්ස, මෛත්‍රී භාවනාවෙන් නිවන් අවබෝධ කළ හැකිදැ'යි** අසන ලද විට උන්වහන්සේ මුවගට මද සිනහවක් නගාගනිමින් ඉතා කෙටි මෙන්ම ගැඹුරු පිළිතුරක් ලබා දුන්හ. එනම්, **"ඔය කිසිම දේකින් නිවන් දකින්න බැහැ"** යන්නයි. එයින් උන්වහන්සේ අදහස් කළේ සිතෙහි නිරෝධය ප්‍රඥා ඇසින් දකිනවිට කිසිවක් එහි නැති ස්වභාවයත් කිසිවකින් හෝ බාධා වේ නම් සිතේ නිරෝධයක් සිදු නොවන බවත් ය.

**සාධු! සාධු!! සාධු!!!**



# ආශ්‍රිත ග්‍රන්ථාවලිය


**ප්‍රාථමික මූලාශ්‍රය**

මජ්ඣිම නිකාය, (2006), ත්‍රිපිටක බුද්ධ ජයන්ති සංස්කරණය, නැදිමාල, කොළඹ.

සංයුත්ත නිකාය, (2006),ත්‍රිපිටක බුද්ධ ජයන්ති සංස්කරණය, නැදිමාල, කොළඹ.

ඉතිවුත්තක අට්ඨකථා, 1927, සංස්. සිරි ධම්මානන්ද හිමි, කොළඹ, ත්‍රිපිටක මුද්‍රණාලය.

උදානට්ඨකථා, 1920, සංස්. බිහල්පොල දේවරක්ඛිත හිමි, කොළඹ, ත්‍රිපිටක මුද්‍රණාලය.

**ද්විතීයික මූලාශ්‍රය**

මලලසේකර, ජී. පී. 1964. ලංකා පාලි සාහිත්‍යය, කොළඹ, ගුණසේන මුද්‍රණාලය.

සිරි සම්බෝධි හිමි, පැණිහෙල. 1999. පාලි භාෂාව හා රචනය, කොළඹ, සමයවර්ධන මුද්‍රණාලය.